## 2022 ජූලි මස මාසික සභා රැස්වීමේ සංශිප්ත වාර්තාව

## තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව

**ස්ථානය - තිස්සමහාරාම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව**
**දිනය - 2022.07.08**
**වේලාව - පෙ.ව. 10.00**

**පැමිණීම -**

| | | |
|---|---|---|
| I. | ඩබ්ලිව්.ජී. උපුල් මහතා | - ගරු සභාපති |
| II. | විදාන ගමගේ සුදත් මහතා | - ගරු උප සභාපති |
| III. | කේ.එච්. ගාමිණී මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IV. | හර්ෂ උදය කුමාර ජයවීර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| V. | ඩබ්.කේ. ටෂිත සමිල මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VI. | ඒ.පී. ධම්මික මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VII. | ආර්.රජිත ප්‍රියදර්ශන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VIII. | චතුමිණී විජේනායක මෙනවිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IX. | ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| X. | ආර්.කේ.එම්. රෝහිත මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XI. | පී.කේ. ආරියසේන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XII. | එන්.ජී. සරත් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIII. | වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIV. | චමින්ද ඩයස් වන්නිගේ මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XV. | ජී.එච්.ජී. නීටා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVI. | වැල්ලගේ ජීවානි මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVII. | ඒ.ඩබ්. නන්දා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |

**නොපැමිණීම -**

| | | |
|---|---|---|
| I. | පී.එල්. වාලි ගුණරත්න මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| II. | එල්.එච්. කුමුදු සුජීව මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| III. | කපිල ඉන්ද්‍රජිත් ශ්‍රීවර්ධන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IV. | එම්.එල්.එම්. හනීෆා මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| V. | ඩබ්.කේ.කේ. ශාන්තිලතා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VI. | ඩබ්.කේ. සිසිර කුමාර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |

ප්‍රථමයෙන්ම සියලුම දෙනා පංචසීලය සමාදන් වීමෙන් අනතුරුව, රට වෙනුවෙන් දිවිපිදූ විරෝධාර රණවිරුවන්ට, ප්‍රාදේශීය සභාවේ ධූර කාලය දරා, මේ වන විට මිය ගොස් ඇති බුද්ධදාස ජයසූරිය මහතා ඇතුළු ගරු සභාපතිවරුන්ට, ගරු උප සභාපති ලෙස සිට මිය ගොස් ඇති ඩබ්.කේ. ප්‍රේමදාස මහතා හා අප සභාව නියෝජනය කළ ගරු සභික, එච්.ජේ.කේ.ජී. විජේරාම මහතාත්, ගරු සභිකවරුන් ඇතුළුව මියගිය සියලුම දෙනාට උපහාර දක්වමින්, විනාඩි දෙකක නිෂ්ශබ්දතාවය පළ කරන ලදී.

ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් 2022 වර්ෂයේ ජූලි මස මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපති, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්, ලේකම්තුමිය ඇතුළු පිරිස පිළිගනිමින් න්‍යාය පත්‍රානුකූලව සභා කටයුතු ආරම්භ කරන ලදී.

අද දින ඉන්ධන නොමැති ගැටළුව පැවතුණද, ගරු සභිකයින් කිහිප දෙනෙක් පා පැදිවලින් සහ තවත් ගරු සභිකවරුන් කිහිප දෙනෙක් බස් රථවලින්ද අද දින මහා සභාවට පැමිණ ඇත. එසේම ලේකම්තුමියද මෙකී අපහසුතා මැද හෝ මහා සභාවට පැමිණීමට කටයුතු කර ඇත. ඉන්ධන නොමැති අසීරුතාවය තිබුණද, බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් ගනු ලබන තීන්දු තීරණ ලබා ගැනීම සඳහා අද දින මහා සභාවට පැමිණීම සම්බන්ධයෙන් සියලුම ගරු සභික මහත්ම මහත්මීන් වෙත ස්තුතිය පුද කරන ලදී.

**(අ) (i) 2022.06.16 වන දින පවත්වන ලද මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

2022.06.16 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන ලෙස ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා යෝජනා කරන ලදී. 2022.06.16 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන බව ගරු ප්‍රාදේශීය සභා සභික චතුමිණි දිල්ෂාණි විජේනායක මෙනවිය යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>සංශෝධන</u>

I. <u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතා</u>

2022.06.16 මහා සභා වාර්තාවේ නිවේදන යටතේ සඳහන් කර ඇති , ගරු සභික, එල්.එච්. කුමුදු සුජීව මහතාගේ නිවාඩු ලිපිය මහා සභාවේ අනුමත කළ නොහැකි බවට ගරු සභිකයින් සියලු දෙනා ඒකමතිකව තීරණය කර ඇති බවට සඳහන් කර තිබුණද, එම නිවාඩු ලිපිය අනුමත කළ හැකිද යන්න පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය වෙත දන්වා යැවීමට එහිදී තීරණ වූ බවට සංශෝධනය විය යුතුය.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>ගරු සභික, එල්.එච්. කුමුදු සුජීව මහතාගේ නිවාඩු ලිපිය පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය වෙත දන්වා යැවීමට තීරණය කළද, එම ලිපියෙහි ඉල්ලුම්කරු ලෙස අත්සන් කර ඇති, එල්.එච්. කුමුදු සුජීව මහතාගේ අත්සන මහා සභා පැමිණීමේ ලේඛනයේ අත්සන සමඟ නොසැසඳෙන බවත්, එම ලිපිය ලියන තැනැත්තාම නම යොදා අත්සන් කර ඇති බැවින්, එම ලිපිය සාවද්‍ය ලේඛනයක් බවත් සඳහන් කරන ලදී.</u>

**(ආ) ගරු සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදනය -**

I. ගරු ප්‍රාදේශීය සභා සභික, පී.එල්. වාලි ගුණරත්න මහතා, ඩබ්.කේ. සිසිර කුමාර මහතා, එල්.එච්. කුමුදු සුජීව මහතා එවා ඇති නිවාඩු ලිපි නිවේදනය කරන ලදී.

ගරු සභික, එල්.එච්. කුමුදු සුජීව මහතාගේ නිවාඩු ලිපිය අනුමත කළ හැකිද යන්න පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය වෙත දන්වා යවා, මේ සම්බන්ධයෙන් පවතින නෛතික ක්‍රියාවලිය සොයා බැලීම සිදු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

තවද, මෙම නිවාඩු ලිපිය ද පසුගිය මස සේම ලිපිය ලියන ලද තැනැත්තා විසින් නම යොදා අත්සන තබා ඇති අතර, ආයතනයේ පවතින ලේඛනවල සඳහන් අත්සන සමඟ නොසැසඳෙන බවත්, මෙම ලිපියද සාවද්‍ය ලේඛනයක් බවත් ප්‍රකාශ කරන ලදී.

ගරු සභික, කපිල ඉන්ද්‍රජිත් මහතා ද දිගින් දිගටම මහා සභාවට නොපැමිණීම සිදුවන බැවින්, ඒ සඳහා ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය වෙත දන්වා යවා උපදෙස් ලබා ගැනීමටත් ගරු සභාපතිතුමා විසින් උපදෙස් ලබා දෙන ලදී.

II. ප්‍රාදේශීය සභා පනතේ 168 (1) හා රීතිවලින් නියම කර ඇති පරිදි මා විසින් වර්ෂය ඉකුත් වීමට පෙර ඉදිරි වර්ෂය සඳහා අය වැය ලේඛණයක් සකස් කර සභාවට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව අනුමත කර ගත යුතු බව සඳහන්ව ඇත.

එසේ සකස් කර ගන්නා වූ අය වැය ලේඛණය පහත පරිදි කාල සටහනට අනුව සකස් කර ගැනීමට මා අපේක්ෂා කරමි. එකී කාල සටහන අනුව ලබන්නා වූ නව වර්ෂය වෙනුවෙන් අය වැය ලේඛණයක් සකස් කිරීමට ඔබ සැමගේ සහයෝගය අපේක්ෂා කරන අතර, මෙකී කාල සටහන අනුව ඔබ සියලු දෙනා මෙන්ම කාරක සභාවල සහාය හා විශේෂයෙන්ම ලේකම් ඇතුළු කාර්යය මණ්ඩලයේ සම්පූර්ණ සහයෝගය අපේක්ෂා කරන අතර, ඒ සඳහා මා හට නියමිත සහයෝගය ලබා දෙනු ඇතැයි අපේක්ෂා කරමි. කාල සටහන අනුව නියමිත දිනට ඔබගේ අදහස් හා යෝජනා ලිඛිතව ලබා ගැනීමටද මා අදහස් කරමි. සියලු දෙනාගේ දැන ගැනීම පිණිස මෙය සභාව වෙත යොමු කරමි.

| අනු අංකය | ක්‍රියාකාරකම්/ පියවරයන් | අවසන් ඉලක්ක දිනය | වගකීම |
|---|---|---|---|
| 01 | මාණ්ඩලික පත්‍රයක් ඉදිරිපත් කිරීම | | සභාපති |
| 02 | අය වැය සඳහා අදහස් හා යෝජනා ලබා ගැනීම | ජුලි 31 | සභාපති ඇතුළු සභිකවරුන්, ලේකම් ඇතුළු කාර්යය මණ්ඩලය, කමිටු සාමාජිකයින්, |
| 03 | ආදායම් හා වියදම් පිළිබඳ ඒ ඒ අංශවල වාර්තා ලබා ගැනීම | ජුලි 31 | අංශ ප්‍රධානීන් හා අයවැය කමිටුව හා විෂයභාර නිලධාරීන් |
| 04 | මූලික ඇස්තමේන්තු සකස් කිරීම | අගෝස්තු 31 | අංශ ප්‍රධානීන් හා අයවැය කමිටුව හා විෂයභාර නිලධාරීන් |
| 05 | මූලික ඇස්තමේන්තු සමාලෝචනය | සැප්තැම්බර් 15 | සභාපති ඇතුළු මන්ත්‍රීවරුන්, ලේකම් ඇතුළු කාර්යය මණ්ඩලය, කමිටු සාමාජිකයින්, |
| 06 | අයවැය ප්‍රතිපත්ති තීරණය කිරීම හා සභාවට ඉදිරිපත් කිරීම | සැප්තැම්බර් 30 | සභාපති |
| 07 | අයවැය ඇස්තමේන්තු සකස් කිරීම | ඔක්තොම්බර් 15 | අයවැය කමිටුව |
| 08 | ඇස්තමේන්තු පරීක්ෂාව | ඔක්තොම්බර් 31 | අයවැය කමිටුව/ මහජනතාව |
| 09 | අයවැය වාර්තාව කෙටුම්පත් කිරීම / අයවැය පණිවිඩය සැකසීම | නොවැම්බර් 15 | සභාපති / අයවැය කමිටුව |
| 10 | කෙටුම්පත් අයවැය ලේඛනය සභාවට ඉදිරිපත් කිරීම | නොවැම්බර් 30 | සභාපති |
| 11 | අවශ්‍යය වේ නම් සංශෝධිත අයවැය ලේඛනය දෙවැනිවර සභාවට ඉදිරිපත් කිරීම | දෙසැම්බර් 15 | සභාපති |
| 12 | අයවැය ලේඛනය අනුමත කිරීම | දෙසැම්බර් 15 | සභාව |
| 13 | අයවැය මුද්‍රණය කර බෙදා හැරීම | දෙසැම්බර් 31 | ලේකම් |

**(ඈ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන**

I. උද්ධකන්දර ප්‍රදේශයේ කසළ ප්‍රතිචක්‍රීකරණ මධ්‍යස්ථානයට නුදුරින් පවත්වාගෙන යනු ලබන කාබනික දියර පොහොර නිෂ්පාදන ව්‍යාපෘතිය හේතුවෙන් ප්‍රදේශයේ ජනතාවට පීඩාකාරී තත්ත්වයක් පවතින බවට ලැබී ඇති පැමිණිලි අනුව, මධ්‍යම පරිසර අධිකාරිය, සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී හා තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව එක්ව සිදු කරන ලද ක්ෂේත්‍ර පරීක්ෂණ වාර්තාව මහා සභාව වෙත ඉදිරිපත් කරන ලදී.

එම වාර්තාව අනුව,

- එම ව්‍යාපෘතිය සිදු කරන ලද පුද්ගලයා ක්ෂේත්‍ර පරීක්ෂණය සිදු කරන අවස්ථාවේ එහි නොසිටි බැවින්, ඔහු පිළිබඳව ග්‍රාම නිලධාරී හරහා තොරතුරු ලබා ගැනීමට කටයුතු කරන ලදී.
- යෝධකණ්ඩිය කොට්ඨාසය භාර මහජන සෞඛ්‍ය පරීක්ෂක නිලධාරීගේ නිර්දේශ වාර්තාවන් ලබා ගැනීමට කටයුතු කරන ලදී.
- ඒකාබද්ධ ක්ෂේත්‍ර පරීක්ෂණය සිදු කරන අවස්ථාවේ ව්‍යාපෘතිය සිදු කර, ඒ වන විට නතර කර ඇති බව එම ස්ථානයේ තිබූ බඳු භාහිරාදිය වලින් සනාථ වී ඇති බැවින්, මෙම ව්‍යාපෘතිය සිදු කරන ඉඩම වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවට අයත් ඉඩමක්ද, පෞද්ගලික ඉඩමක්ද යන්න සොයා බලා, එම ව්‍යාපෘතිය සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් පාරිසරික ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගැනීමට ඉදිරි කටයුතු සිදු කරන බවට පරීක්ෂණ වාර්තාවේ නිර්දේශ මගින් පෙන්වා දී ඇත.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>මේ සම්බන්ධයෙන් ලේකම්තුමියගේ උපදෙස් මත, පරිසර නිලධාරී ඇතුළු තවත් නිලධාරීන් පිරිසක් එක්ව ක්ෂේත්‍ර පරීක්ෂණයක් සිදු කර, ඊට අදාළ වාර්තාව ඉදිරිපත් කර ඇති බැවින්, එහි නිර්දේශයන්ට අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට තීරණය විය.</u>

**(ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා -**

- **<u>ගරු සභාපති විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනා</u>**

01. 2022.05.09 වන දින ප්‍රචණ්ඩකාරී පිරිස් විසින් සභාව සතු PF-7365 දරණ කැබ් රථයට අලාභ හානි සිදු කිරීම පිළිබඳ මුදල් රෙගුලාසි 104-(3) යටතේ ප්‍රාරම්භක පරීක්ෂණය සිදු කර, අදාළ වාර්තාව පළාත් පාලන කොමසාරිස් කාර්යාලය වෙත හා පළාත් පාලන සහකාර කොමසාරිස් කාර්යාලය වෙත යොමු කිරීමෙන් අනතුරුව ලද උපදෙස් පරිදි, මුදල් රෙගුලාසි 104-(4) යටතේ අවසන් වාර්තාව සැකසීම සඳහා පහත නම් හා තනතුරු සඳහන් පරීක්ෂණ කමිටුව විධිමත් පරිදි පත් කිරීම සුදුසු බවට මෙම ගරු සභාව යෝජනා කරමි.

I. ආර්.එම්.පී. රාජපක්ෂ මහතා - සහකාර කළමනාකාර ඉංජිනේරු (ලංගම ඩිපෝව - කතරගම)
II. ආර්.ඒ.එස්. ජානක මහතා - විමර්ෂණ නිලධාරී (ප.පා.ස.කො.කාර්යාලය - හම්බන්තොට)
III. එල්.පී. ජගත් කුමාර මහතා - තාක්ෂණ සේවා නිලධාරී (ප්‍රා.ස - තිස්සමහාරාම)

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

02. PF-7365 අංක දරණ කැබ් රථය මුදල් රෙගුලාසි 104-(3) ප්‍රකාරව පත් කළ කමිටුව මගින් අලාභයන් පිළිබඳව ප්‍රාරම්භක වාර්තාව පළාත් පාලන කොමසාරිස් කාර්යාලය හා පළාත් පාලන සහකාර

කොමසාරිස් කාර්යාලය වෙත යොමු කර ඇති අතර, කැබ් රථය සඳහා ඉදිරිපත් කරන ලද අලුත්වැඩියාවට අදාළ ඇස්තමේන්තු සලකා බලා, රක්ෂණ ආයතනයද දැනුවත් කරමින් සුදුසු සේවා ආයතනයකින් එම අලුත්වැඩියාව විධිමත් පරිදි සිදු කර ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

03. අද රට තුළ පවතින භාණ්ඩ හිඟය හා භාණ්ඩ මිල අධික ලෙස ඉහල යාම නිසා සභාවේ නඩත්තු කටයුතු, සංවර්ධන වැඩසටහන් හා අනෙකුත් අත්‍යාවශ්‍ය කාර්යයන් සඳහා භාණ්ඩ මිලදී ගැනීමේදී 2022 වර්ෂය සඳහා ලියාපදිංචි වී ඇති සහ නොමැති සැපයුම්කරුවන් මිල ගණන් ලබා දීම ප්‍රතික්ෂේප කිරීම හා භාණ්ඩ මිලදී ගන්නා ලද අවස්ථාවේදීම මුදල් ගෙවීමට සිදු වීම මත, සභාවට අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීම ගැටළුවක්ව පවතින බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>මේ දිනවල භාණ්ඩවල මිල ඉහල යාමක් සිදු වී ඇති බැවින්, සභාවේ නඩත්තු කටයුතු, සංවර්ධන වැඩසටහන් හා අනෙකුත් අත්‍යාවශ්‍ය කාර්යයන් සඳහා, සභාවට අවශ්‍ය භාණ්ඩ මිලදී ගැනීමේ දැඩි ගැටළුවක් පවතින බැවින්, මෙකී ගැටළුකාරී තත්ත්වය ගරු ආණ්ඩුකාරතුමා වෙත ලිපියක් මගින් දන්වා යැවීමට උපදෙස් ලබා දෙන ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

04. තිස්සමහාරාම බල ප්‍රදේශය තුළ සිදුවන අවමංගල්‍ය කටයුතු වෙනුවෙන් මඩු පුටු, කොඩි කණු, වතුර බවුසර් ආදිය ලබා දීම සඳහා ක්‍රමවත් වැඩපිළිවෙලක් සකස් කිරීම කළ යුතු බැවින්, අප ආයතනයේ සේවය කරන ටී.ජී. සොමිරත්න, ටී.එච්. කරුණාදාස, බී.කේ. විමලරත්න යන සේවකයින් යොදවා එම කටයුත්ත සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>මෙම වැඩපිළිවෙල රට යථා තත්ත්වයට පත් වූ විගසම ක්‍රියාත්මක කිරීමට තීරණය විය.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් ස්ථාන වල පිහිටි කඩ කාමරයේ බදු අයිතිය පහත පරිදි සංශෝධනය කිරීම සුදුසු බවට යෝජනා කරමි.

| අනු අංකය | ස්ථානය | කඩ කාමර අංකය | දැනට බදු අයිතිය | පැවරීම | සම්බන්ධය |
|---|---|---|---|---|---|
| 1 | තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම් පොළ | 04 | එස්.ඒ. කරෝලිස් අප්පුහාමි | හේවා අහංගමගේ චමරි සුරේකා | එක්වන් මුදල ගෙවා |
| 2 | තිස්සමහාරාම පරණ බස් නැවතුම් පොළ කඩ කාමර | 10 | එන්.කේ. රම්‍යා නිලානි සමරවීර | ඩබ්.එම්. වික්‍රමරත්න | එක්වන් මුදල ගෙවා |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06. රට තුළ පවතින ඉන්ධන අර්බුදය හේතුවෙන් දැනට තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු වාහන සඳහා ඉන්ධන ලබා ගන්නා ඉන්ධන පිරවුම්හලෙන් තොග අවසන් වී ඇති අවස්ථාවල, කසළ එකතු කිරීමේ සේවය අඛණ්ඩව පවත්වාගෙන යාම අත්‍යාවශ්‍ය බැවින්, ප්‍රදේශයේ වෙනත් ඉන්ධන පිරවුම්හල් / ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට අයත් ඉන්ධන පිරවුම්හල් මගින් අත්පිට මුදලට ඉන්ධන ලබා ගැනීම සඳහා අත්තිකාරම් මුදලක් ලබා ගෙන හෝ ඉන්ධන මිලදී ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>සභාවේ වාහන සඳහා ඇණවුම් මගින් ඉන්ධන ලබා ගනු ලබන්නේ තිස්සමහාරාම ඉරේෂා පිලිං ස්ටේෂන් ආයතනයෙන් වුවත්, එහි ඉන්ධන නොමැති අවස්ථාවන්වලදී ප්‍රදේශයේ පවතින අනෙක් ඉන්ධන පිරවුම්හල් වෙතින් ඇණවුම්වලට ඉන්ධන ලබා නොදෙන බැවින්, එම ආයතන වෙතින් අත්පිට මුදලට ඉන්ධන ලබා ගැනීම සඳහා අත්තිකාරම් මුදලක් ලබා ගැනීමට සිදු වන බව දන්වා සිටින ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ **<u>රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

- **<u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

07. පන්නෙගමුව ග්‍රාම නිලධාරී වසමේ රාජපක්ෂ මාවත සහ අංජලිගල ග්‍රාම නිලධාරී වසමේ ගල් රැන මාවත බොරලු යොදා සංවර්ධනය කිරීම සිදු කළ යුතු බැවින්, රාජපක්ෂ මාවත සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තු ගත මුදල වන රු. 3,414,165.12 ක මුදල සහ ගල් රැන මාවත සංවර්ධනය කිරීම සඳහා ඇස්තමේන්තු ගත මුදල වන රු. 3,414,165.12 ක මුදල යටතේ එම මාර්ග 02 සෘජු ශ්‍රමික පදනම මත සභා අරමුදලින් සිදු කිරීමටත්, එකී මාර්ග 02 සංවර්ධනය කිරීමට අවශ්‍ය බොරලු ප්‍රවාහනය කිරීම සඳහා ටිපර් රථ කුලී පදනම මත ලබා ගැනීම සුදුසු බවටත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා</u>

අප පත් වූ ප්‍රාදේශීය සභා වසර 04 ක කාලය තුළ ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් සභාව විසින් ගමින් ගම නගමු ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම, කොට්ඨාස මට්ටමින් ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය එක්ව ජංගම සේවා වැඩසටහන් පැවැත්වීම, ආයුර්වේද වෛද්‍ය ආයතන පැවැත්වීම, කාවන්තිස්සපුර කොට්ඨාසයේ විශේෂඥ ජංගම සේවා වැඩසටහනක් පැවැත්වීම, ඩෙංගු මර්ධන වැඩසටහන් සිදු කිරීම, පානීය ජලය නොමැති ගම්මාන සඳහා ජලය බෙදා හැරීමේ වැඩසටහන් සිදු කිරීම, දිළිඳ පවුල් සඳහා වැසිකිළි ආධාර ලබා දීම, ප්‍රදේශයේ පාසල් සම්බන්ධ කර ගනිමින් ගෙවතු වගා වැඩසටහන් සිදු කිරීම, නගර අලංකරණ වැඩසටහන් සිදු කිරීම, සුසාන භූමි හා ක්‍රීඩා පිටි එළිපෙහෙළි කිරීමේ වැඩසටහන් හා ඒවායෙහි සීමා මායිම් කණු සිටුවීමේ කටයුතු සිදු කිරීම, කොවිඩ් රෝගය රට පුරා ව්‍යාප්ත වූ කාලයේ අප ප්‍රදේශයේ ජනතාව ඉන් මුදවා ගැනීම සඳහා කොවිඩ් එන්නත් මාත්‍රා ලබා දීම සඳහා මැදිහත් වී කටයුතු කිරීම, කොවිඩ් රෝගය වෙනුවෙන් නිරෝධායනය වූ පවුල් සඳහා වියළි ආහාර මලු ලබා දීම ආදී වැඩසටහන් සියල්ල ජනතාව වෙනුවෙන් සිදු කරන්නාවූ සේවාවන් රැසක් වන බවත්, එකී සෑම කාර්යයක්ම ගරු සභාපතිතුමා විසින් විනිවිදභාවයෙන් හා නිවැරදිව සිදු කිරීමෙන් මා ඇතුළු ගරු සභික මඩුල්ලේම අභිමානය ආරක්ෂා කරමින් ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටද අභිමානයක් ඇති කරමින්, ඉතිහාසයේ විගණන දෙපාර්තමේන්තුව විසින් ගිණුම්කරණ මූලා ධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් අප සභාවට නිර්දේශ ලබා දී ඇත.

එසේම ගරු සභාපතිතුමා විසින් සතියේ දින 07 තුළම සභාවේ රැඳී සිට සභාවේ කටයුතු සඳහා දැඩි දායකත්වයක් ලබා දෙමින් ප්‍රදේශයේ ජනතාවට මහඟු සේවයක් ඉටු කර දීම සඳහා ඇප කැප වී කටයුතු කර ඇත.

විශේෂයෙන් ඉතිහාසයේ පළමු වතාවට සේවක සුභ සාධක සමිතියට ආධාර පිණිස සිදු කරන ලද වැඩසටහන මගින් ලබා ගත් රු 1,000,000.00.00 ක මුදල සේවක සුභ සාධක සමිතියට ලබා දෙමින් හා සභාව විසින් එළිදැක්වීමට කටයුතු කරන ලද මාගම්පත්තු පුරාණය-01 කෘති ප්‍රමාණය අලෙවි කිරීමෙන් ලබා ගැනීමට නියමිත රු. 900,000.00 ක මුදල ද සුභ සාධක සමිතියට ලබා දෙමින් සේවකයින්ගේ සුභ සාධණය වෙනුවෙන් වඩාත් ඵලදායි සේවයක් ඉටු කර දීමට කටයුතු කර ඇති අතර, සෞඛ්‍ය අංශයේ සේවකයින් සඳහා අප පාලන කාලය පත් වීමට පෙර උදෑසනට රෝල්ස් එකක් සහ තේ එකක් ලබා දී තිබූ අතර, එයද අප පත් වූ පසු, ගරු සභාපතිතුමාගේ යෝජනාවක් ලෙස සෞඛ්‍ය අංශයේ සියලුම සේවකයින් සඳහා දිවා ආහාර පාර්සලයක් ලබා දී, ඔවුන්ව දිරිමත් කිරීමටත් ගරු සභාපතිතුමා විසින් කටයුතු කිරීමෙන් සේවකයන්ගේ සුභ සාධනය ඉහල නැංවීමට ද කටයුතු යොදා ඇත.

එලෙස අප ප්‍රදේශයේ ජනතාවට මහඟු සේවයක් ඉටු කළ ගරු සභාපතිතුමා විසින් බල ප්‍රදේශයේ මාර්ග කාපට් කර සංවර්ධනය කර දීමට මැදිහත් වී කටයුතු සිදු කළද, එතුමන් යෝජනා කරන ලද ඉහත මාර්ග 02 මෙතෙක් සකස් කර ගැනීමට එතුමන් විසින් මේ දක්වා කටයුතු සිදු කර ගෙන නොමැත. ඉහතින් සඳහන් පන්නෙගමුව රාජපක්ෂ මාවතේ පවුල් 30 ක් පමණ ජීවත් වන අතර, අංජලිගල ගල් රෑන මාවතේ පවුල් 40 ක් පමණ ජීවත් වන බැවින්, මෙකී මාර්ගයන් 02 ගරු සභාපතිතුමාගේ කොට්ඨාසය තුළ පවතින මාර්ග 02 ක් වන නිසාම නොව, එම මාර්ග 02 හි ජීවත් වන සියලුම පවුල් වෙනුවෙන් සහ එකී මාර්ගයන් දෙකෙහි වර්ෂා කාලයට ගමන් කිරීමට නොහැකි ලෙස අබලන් වී ඇති බැවින්, මෙකී මාර්ග 02 සකස් කිරීම කළ යුතුය. එසේම අප ගරු සභාපතිතුමා අප බල ප්‍රදේශයට සේම ජනතාවට සිදු කර ඇති සේවාව වෙනුවෙන් එතුමන්ට තුති පිදුමක් ලෙසත් මෙකී මාර්ග 02 බොරලු යොදා නඩත්තු කර දීම සුදුසු බවට යෝජනා කරමි.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) කාරක සභාවල වාර්තා සළකා බැලීම -**

❖ 2022.07.01 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ 2022.07.01 වන දින පැවති නිවාස හා ප්‍රජා කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ 2022.07.01 වන දින පැවති කාර්මික සේවා කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ 2022.07.01 වන දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

## (උ) වෙනත් කරුණු

❖ **<u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතාගේ අදහස් දැක්වීම</u>**

2022.05.09 වන දින අප හට සිදු වුයේ ඉතාමත් ප්‍රචණ්ඩකාරී සිදුවීමකි. එම විනාශකාරී සිදුවීමෙන් මාගේ නිවස, දේපළ සේම වාහන ද කඩා බිඳ දැමීමට කටයුතු සිදු කරන ලදී. එම සිදුවීමෙන් මාගේ වාහන සේම, සභාවේ කැබ් රථය ද බිඳ දමා විනාශ කිරීමක් සිදු කරන ලදී. එම සිදුවීමෙන් මා ඇතුළු මාගේ පවුලේ අය දැඩි මානසික පීඩනයකට පත්ව සිටින අවස්ථාවකදී එම සිදුවීම නිවැරදි කිරීම සඳහා මාගේ පුතාගේ නමින් Facebook ගිණුමක් සාදා මාගේ නිවසේ තිබූ වාහන කඩා බිඳ දැමීමේ සිදුවීම අප විසින්ම සිදු කර ගෙන ඇති බවට සටහනක් තම පුතාගේ නමින් පල කර සිදු කර ඇති ක්‍රියාව ඉතාමත් වැරදි ක්‍රියාවකි. මෙලෙස වංචනික ලෙස Facebook ගිණුමක් සාදා සිදු කරන ලද ක්‍රියාව සම්බන්ධයෙන් අප තිස්සමහාරාම පොලිස් ස්ථානයේ පැමිණිල්ලක් ගොණු කරන ලදී. එසේම පරිගණක තාක්ෂණයෙන් මෙලෙස වැරදි වංචනික ක්‍රියාවක් සිදු කර ඇත්තේ කෙසේද යන්නත් තොරතුරු ලබා ගැනීමට මේ වන විට කටයුතු කරමින් පවතින බැවින්, මෙම පුවතේ සත්‍යතාවය ඉදිරියේ දී සියලුම දෙනාගේ දැන ගැනීම පිණිස දැන්වීමට කටයුතු කරන බවත් දන්වා සිටින ලදී.

අප හට සිදු කළ මෙම විනාශකාරී සිදුවීමත් සමඟ වංචනික ලෙස මාගේ පුතාගේ නමින් Facebook ගිණුමක් සාදා වැරදි පුවතක් පල කර අප තව තවත් මානසිකව වට්ටවා, අප බිය ගැන්වීමට කටයුතු කරන්නේ නම්, එය කිසි දිනක සිදු නොවන දෙයකි. එසේම මෙවැනි සිදුවීම් තුළින් අපගේ දේශපාලන ගමන නවතා දැමීමටත් කිසි දිනක නොහැක.

තවද, මෙලෙස වංචනික ලෙස Facebook ගිණුමක් සාදා සිදු කරන ලද සිදුවීම සම්බන්ධයෙන් නිවැරදි කිරීමක් කිසි දිනක කිසිදු අයෙක් සිදු නොකල යුතුය. එම සිදුවීම නිවැරදි කිරීමට යම් කෙනෙකු කටයුතු කරන්නේ නම්, අප සිතිය යුත්තේ ඔවුන්ද මෙකී සිදුවීමට සම්බන්ධ පිරිසක් ලෙසයි. එසේම මෙම ක්‍රියාව සිදු කළ අය සඳහා දැඩි ලෙස නීතිය ක්‍රියාත්මක කිරීමක් සිදු නොකරන්නේ නම්, අප හට සිදු වූ මෙම සිදුවීමට කිසි දිනක සාධාරණයක් ඉටු නොවනු ඇත. 2022.05.09 වන දින සිදු වූ ප්‍රචණ්ඩකාරී ක්‍රියාවෙන් මානසිකව වැටී තිබූ අපගේ හිත් මෙම වංචනික ක්‍රියාව හේතුවෙන් නැවතත් මානසිකව වැටී ඇති බව කණගාටුවෙන් සඳහන් කරන ලදී.

රටක් පාලනය කරන්නේ අප නියෝජනය කරන දේශපාලන පක්ෂයකි. එම පක්ෂය තුළින් අප පෙනී සිට බල ප්‍රදේශයට සේවයක් ඉටු කිරීමට කැප වී ඇත. එලෙස කැප වී කිසිදු වංචාවකින් තොරව අප ජනතා සේවය ඉටු කර ඇති බවට විගණකාධිපති විසින්ද මතයක් ලබා දී ඇත. එලෙස අප කටයුතු කිරීමේ දී කිසිදු පාට පක්ෂ භේදයක් නොබලා සියලුම දෙනාට සහාය ලබා දී සහෝදරයින් සේම කටයුතු කළද, අප සහෝදරයින් සේ සිතා කටයුතු කළ අයම අපට මෙවැනි ප්‍රචණ්ඩකාරී ක්‍රියාවක් සිදු කිරීම කණගාටුදායක තත්ත්වයකි. අප දේශපාලනය සිදු කිරීමේ දී අපට දේශපාලන මතයක් තිබේ. ඒ අනුව කටයුතු කිරීමට අපට සිදු වනු ඇත.

2022.05.09 දින සිදු වූ ප්‍රචණ්ඩකාරී ක්‍රියාවේදී ගරු සභික, එල්.එච්. කුමුදු සුජීව මහතා, මාගේ නිවස කුඩු කර දැමීමට පැමිණ සිටි බවට ඇසින් දුටු සාක්ෂි තිබෙන නිසා ඒ අනුව, ඔහු සැකකරුවෙකු ලෙස පොලිස් ස්ථානය වෙත පැමිණිල්ලක් ගොණු කර ඇත. ඔහු එසේ සැකකරුවකු සේ නම් වී

තිබියදී අද දිනත් මහා සභාවට නිවාඩු අනුමත කරන ලෙස ලිපියක් එවා තිබුණද, එය අනුමත කළ හැක්කේ පළාත් පාලන සහකාර කොමසාරිස්තුමියගේ දන්වා යවා, එමගින් ලැබෙන උපදෙස් අනුව බවත් වැඩි දුරටත් සඳහන් කරන ලදී.

අපගේ මෙම සභා කාලය තුළ සෑම පක්ෂයකම ගරු සභිකයින් එක්ව සහයෝගයෙන් සහෝදරයින් සේ කටයුතු කරන ලදී. නමුත් 2022.05.09 වන දින සිදු වූ ප්‍රචණ්ඩකාරී ක්‍රියාවට ජනතා විමුක්ති පෙරමුණ ගරු සභිකයින් ද සම්බන්ධ වී තිබූ බැවින්, පසුගිය දිනක මහා සභාවකදී එම ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේ ගරු සභිකයින් දෙදෙනාට එල්ල කළ දෝෂාරෝපණය වෙනුවෙන් කණගාටුව ප්‍රකාශ කරන ලදී. එලෙස දෝෂාරෝපණ එල්ල කිරීමට සිදු වූයේ මා ඇතුළුව ප්‍රචණ්ඩකාරී ක්‍රියාවට මුහුණ දුන් ගරු සභිකයින් සිටි මානසික තත්ත්වය නිසාය. තවද, මෙකී සිදුවීම හැරෙන්න අප සභා කාලය තුළ කිසිදු ගැටළුවක් ඇති කර නොගත් බවත්, එම සිදුවීමට නැවතත් කණගාටුව ප්‍රකාශ කරන බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.ඩබ්. නන්දා මහත්මියගේ අදහස් දැක්වීම**

ඉන්ධන ගැටළුව තිබුණද ගරු සභිකයින් පාපැදිවලින් සහ බස් රථවලින් හෝ අද දින මහා සභාවට පැමිණීම සතුටට කරුණකි. එසේම ඉදිරි කටයුතු සාර්ථකව සිදු කර ගෙන යාමට සියලුම දෙනාට ශක්තිය ධෛර්ය ලැබේවායි ප්‍රාර්ථනා කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා සභික, චමින්ද ඩයස් වන්නිගේ මහතාගේ අදහස් දැක්වීම**

රට තුළ මේ වන විට ඇති වී තිබෙන අර්බුදය හමුවේ ඉන්න හිටින්න රටක් ඕන කිව්වට, අද වන විට බොහෝ තරුණ තරුණියන් අප රට අතහැර යාමට කටයුතු කරයි. රට තුළ පක්ෂ තුළින් විවිධ කණ්ඩායම් සාදා ගෙන කටයුතු කිරීමේදී ඒ සඳහා බිලි වීමට සිදු වන්නේ තරුණ පරම්පරාවටයි. ජන අරගල සිදු කළත් එමගින් අන් අයට පීඩාවක් විනාශකාරී සිදුවීමක් සිදු නොකර, යම්කිසි රාමුවක් තුළ සාමකාමීව එකී කටයුතු සිදු කර ගෙන යා යුතුය. එසේම අරගල සිදු කරන්නේ නම් එය නිර්පාක්ෂිකව සිදු කළ යුතුය. ඉදිරියේ එළඹෙන 2022.07.09 වන දිනත් අරගලයක් සිදු කිරීමට නියමිත බැවින්, සියලුම දෙනා ආරක්ෂාකාරීව සිටිය යුතු බවත් සඳහන් කරන ලදී.

එසේම යම්කිසි කෙනෙකු විසින් 2022.05.09 වන දින අප ප්‍රදේශයේ සිදු කළ ප්‍රචණ්ඩකාරී ක්‍රියාවට සම්බන්ධ වී ඇත්නම් ඒ සියලුම දෙනාට නීතියෙන් දඬුවම් ලැබිය යුතුය. තවද, මේ සඳහා නීතිය ක්‍රියාත්මක වීම ප්‍රමද වන්නේ මන්ද යන්නත් සොයා බැලීමක් සිදු කළ යුතු බවත් දන්වා සිටින ලදී.

අප රට මෙම වැටුණු වලෙන් ගොඩ නැගීමට නම් පාට පක්ෂ භේද නොබලා සියලුම දෙනා එක්ව කටයුතු කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී.සරත් මහතාගේ අදහස් දැක්වීම**

රට තුළ අර්බුදකාරී තත්ත්වයන්, ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් කුමක් සිදු වුවත් ඒ සෑම දේම සිදු වන්නේ රටේ ජනතාවටයි. මෙකී තත්ත්වයන් සම්බන්ධයෙන් ගමේ සිටින ඇතැම් දේශපාලන පක්ෂවල ගරු සභිකවරුන් ජනතාව වෙත විවිධ විවිධ කතා ප්‍රකාශ කර, ජනතාව උසි ගන්වනු ලබයි. ඉන්ධන පෝලිම්වල සිටින අතරතුර ජනතාව විසින් ප්‍රකාශ කරන අදහස් වලින් පැහැදිලි කර ගත හැක්කේ මෙම සියලු අදහස් ජනතා විමුක්ති පෙරමුණ පක්ෂයේ ගරු සභිකයින්ගේ අදහස් බවයි. යම් පක්ෂයක් විසින් ජනතාව උසි ගන්නවා එම දේශපාලන පක්ෂය ඉදිරියට ගෙන යාමට උත්සාහ දරන්නේ නම්, එලෙසට යන දේශපාලන ගමන කිසි දිනක සාර්ථක නොවන බවත් කිව යුතුය.

එසේම රටේ තරුණ පිරිස උසි ගන්නවා එමගින් දේශපාලන පටු අරමුණු ඉටු කර ගැනීමට ද ඇතැම් දේශපාලන පක්ෂ කටයුතු කරනු ලබයි. කුමන හෝ දේශපාලන පක්ෂයක් රට වෙනුවෙන් යම් දෙයක් සිදු කරන්නේ නම්, එය රට වෙනුවෙන් සහ රටේ ජනතාවට සෙතක් වන ආකාරයෙන් සිදු කළ යුතුය. එසේ සිදු කිරීමේ දී ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් සිදු නොකර, දේශපාලන ගමන ශක්තිමත් කර නිවැරදි ගමනක් යාමට යම් දේශපාලන පක්ෂයක් කටයුතු කරන්නේ නම්, ඒ සඳහා අපගේ ද සහාය ලබා දෙන බව ප්‍රකාශ කරන ලදී.

මේ වන විට රටේ පවතින ඉන්ධන අර්බුදය හමුවේ රටේ ජනතාව දැඩි අසරණභාවයකට පත්ව ඇත. එසේම එදිනෙදා ආහාරවේල සපයා ගැනීම සඳහා සිදු කරනු ලබන ගොවිතැන් කටයුතුවලට අවශ්‍ය ඉන්ධන ලබා ගැනීමට ද එම අසරණ ගොවි මහතුන්ට නොහැකි වී ඇත. එම නිසා රටේ ජනතාව සේම අපගේ ගොවි ජනතාවද පත්ව ඇති අසරණභාවයෙන් මුදවා ගැනීමට හැකි නම් එය රටේම ජනතාවට සිදු කරන්නා වූ මහඟු සේවයක් වන බවත් දන්වා සිටින ලදී.

❖ <u>**ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතාගේ අදහස් දැක්වීම**</u>

ඉන්ධන අර්බුදකාරී ගැටළුව පැවතුණත් අද දින මහා සභාව සඳහා ගරු සභිකයින් සහභාගී වී මහා සභාව පැවැත්වීමට හැකි වීම සම්බන්ධයෙන් සතුටු වන බවත්, මෙකී තත්ත්වය හමුවේ මහා සභාව පැවැත්වීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාට ස්තුතිය පුද කරන බවත් දන්වා සිටින ලදී.

❖ <u>**ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතාගේ අදහස් දැක්වීම**</u>

ප්‍රාදේශීය සභා කාලයන් තුළ පත් වූ අවාසනාවන්තම සභිකයින් පිරිස අප විය යුතුය. අප පත් වූ කාලය තුළ රට තුළ සිදු වූ සහරාන්ගේ බෝම්බ ප්‍රහාරය, කොරෝනා වසංගත තත්ත්වය ආදි ව්‍යවසන සේම මේ වන විට උද්ගතව ඇති ආර්ථික, ඉන්ධන අර්බුදකාරී තත්ත්වයන් හමුවේ ජනතාව වෙනුවෙන් මෙන්ම අපගේ ගම වෙනුවෙන් සිදු කළ හැකි වූයේ ඉතා අල්ප සේවාවන් ප්‍රමාණයකි. අප සභිකයින් ලෙස මෙම ධූරය සඳහා පත් වූයේ ගමේ සේම ජනතාවගේ අවශ්‍යතාවයන් ඉටු කර දීම සඳහා වුවත්, අවාසනාවන්ත ලෙස සිතූ පරිදි එම සේවාවන් ඉටු කර දීමට අපට නොහැකි වී ඇත. එසේ ගත් කළ තරුණ සභිකයෙක් ලෙස ප්‍රාදේශීය සභාවට තේරී පත් වුවද, ජනතාවට අවශ්‍ය සේවාවන් ඉටු කර දීමට නොහැකි වීම සම්බන්ධයෙන් කණගාටු වන බව ප්‍රකාශ කරන ලදී.

තවද, රට තුළ මේ වන විට උද්ගතව ඇති අර්බුදකාරී තත්ත්වයට එක් කණ්ඩායමක් පමණක් වගකිව යුතු නොවේ. මෙකී තත්ත්වයන් සඳහා නිදහසින් පසුව මේ දක්වා රට පාලනය කළ සියලුම දේශපාලන පක්ෂ නායකයින් සේම රාජ්‍ය නිලධාරීන් ද වගකිව යුතුය. එසේම රට මෙලෙසට අරාජික රටක් බවට පත් වීමට බෙහෙවින්ම බලපා ඇත්තේ ඉහල රාජ්‍ය නිලධාරීන්ගේ ද ක්‍රියාකලාපයන් නිසා බවත් ප්‍රකාශ කර සිටින ලදී.

මේ දිනවල පවතින ඉන්ධන පෝලිම්වලද ජනතා විමුක්ති පෙරමුණ පක්ෂය විසින් ජනතාවට ඔවුන්ගේ මතය ප්‍රකාශ කර දන්වා සිටන්නේ රටට මෙම තත්ත්වය උදා වී ඇත්තේ රාජපක්ෂ පාලනය නිසා බවයි. එලෙසට විවිධ මත ප්‍රකාශ කර මෙම ඉන්ධන පෝලිම්වලද විවිධ ගැටුම් ඇති කරවීමට සැලසුම් සහගතව කටයුතු කරනු ලබයි. මෙවැනි සිදුවීම් ගැන සිතා බැලීමේ දී අපට මෙම රට තුළ ජීවත්වීමත් කණගාටුදායක තත්වයකි. අප ශ්‍රී ලංකාව තුළ ජීවත් වීමට දැඩි ආසාවක් දැක්වුවද, මෙම තත්ත්වයන් සමඟ එම ආසාව නැති වී ගොස් ඇත. එසේ අපට රට එපා වන තත්ත්වයකට පත් කරලීමට කටයුතු කිරීම රට මෙම තැනට ගෙන ඒමට කටයුතු කළ නිදහසින් පසු රට පාලනය කළ සියලුම දේශපාලන කණ්ඩායම් වගකිව යුතු වන බවත් දන්වා සිටින ලදී.

2022.05.09 වන දින සිදු කළා වැනි ප්‍රචණ්ඩකාරී ක්‍රියාවක් 2022.07.09 වන දිනත් සිදු කිරීමට සැලසුම් සකස් කරමින් යන බවට ප්‍රචාරයක් පවතී. 2022.05.09 වන දින ගෝල් ෆේස් අරගල නිසා අප ප්‍රදේශවල නිවාස ගිණි තැබීම්, කුඩු කර දැමීම් සිදු කළ බවට ප්‍රචාරය වුවත්, ගෝල් ෆේස් අරගලය ඇති නොවුනත් අප ප්‍රදේශවල මෙම ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් සිදු කිරීමට පෙර සිටම සැලසුම් කර ගෙන තිබූ බවට කරුණු දැන ගැනීමට ලැබුණු බවත් දන්වා සිටින ලදී.

රට තුළ සේම අප ප්‍රදේශයේ ද මේ දිනවල සොර සතුරු උවදුරු බහුල වශයෙන් පවතී. රත්රන් මාල කඩා ගැනීම් බෙහෙවින්ම සිදු වේ. ඇතැම් පිරිස් මත් කුඩු, අයිස් මත් ද්‍රව්‍ය, කසිප්පු, ගංජා වැනි මත් ද්‍රව්‍ය භාවිතය සඳහා ඇබ්බැහි වීමෙන් මෙකී සොරකම් වැඩි වශයෙන් සිදු වනු ඇත. මෙලෙස මත් ද්‍රව්‍ය සඳහා ජනතාව හුරු වීමෙන් සමාජය දැඩි ලෙස විනාශ වී ඇති බවත් සඳහන් කළ යුතුය.

ඉන්ධන පෝලිම්ද මේ දිනවල විනෝදකාමී ස්ථානයක් බවට ජනතාව පත් කර ගෙන ඇත. මෙම පෝලිම්වල සිටීමෙන් පවුල් ආරවුල් ද ඇති වී තිබෙන අවස්ථාවන් බොහෝ පවතී. එම නිසා මේවා සම්බන්ධයෙන්ද සොයා බලා කටයුතු කළ යුතුය.

2022.05.09 වන දින අප ප්‍රදේශයේ සිදු කරන ලද ප්‍රචණ්ඩකාරී ක්‍රියාවන් හමුවේ අප එදින ගැටුම් සඳහා මැදිහත් වීමක් සිදු නොකර බලා සිටියද, 2022.07.09 වන දින එසේ නොවන බවත් වගකීමෙන් යුතුව සඳහන් කරන ලදී. එසේම ඉදිරියේ ද මෙවැනි සිදුවීමක් නැවතත් සිදුවුවහොත් ඕනම අවස්ථාවක තමා ඒ වෙනුවෙන් පෙනී සිට කටයුතු කරන බවත් දන්වා සිටින ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතාගේ අදහස් දැක්වීම</u>**

2022.07.01 වන දින පැවැති කාර්මික සේවා කාරක සභාවේ දී, බොරලු මාර්ග සකස් කිරීමේ දී එය විධිමත්ව සිදු කරන ලෙසට තම අදහස් දැක්වීම් දක්වා තිබුණද, එකී අදහස එම වාර්තාවේ සටහන් වී නොමැති බැවින්, එය නිවැරදි කිරීමක් සිදු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

ගිය මහා සභාවේ දී ගරු සභික, එල්.එච්. කුමුදු සුජීව මහතා නිවාඩු ලිපියක් ලබා දී තිබූ අවස්ථාවක මා ද එම අවස්ථාවේ ප්‍රකාශ කරන ලද්දේ ඔහු නිවාඩු ලිපියක් ලබා දී ඇති නිසා, එය අනුමත කළ හැකිද නොහැකිද යන්න කොමසාරිස් වෙත දන්වා යැවීම සුදුසු බවටයි. නමුත් අද දින මහා සභාවට ද ඔහු නිවාඩු ලිපියක් එවා තිබුණත්, එහි අත්සන ඔහුගේ නොවන බවට මහා සභාවේ දී දන්වන ලදී. ඔහුගේ නිවාඩු අනුමත කර ගැනීම සඳහා වෙනත් අත්සනකින් යුතුව ලිපියක් එවා සභාවද නොමග යැවීමට කටයුතු කිරීම සම්බන්ධයෙන් කණගාටුවන බව ප්‍රකාශ කරන ලදී.

ප්‍රාදේශීය සභාවේ පාලක පක්ෂය අප නොවුනත්, පත්වන සෑම පාලක පක්ෂයක් සඳහාම මාගේ සහාය ලබා දී කටයුතු කරනු ලබන්නේ අප ප්‍රදේශයට සේවයක් ඉටු කර ගැනීමේ බලාපොරොත්තුවෙන්ය. රට පාලනය කළ සෑම ආණ්ඩුවක්ම වැරදි කළ නිසා රටට මෙවැනි තත්ත්වයක් උද්ගත වීමට හේතු වී ඇත. එම නිසා මේ දිනවල රටේ පැවැති තත්ත්වයට එක් කණ්ඩායමක් පමණක් වගකිව යුතු නොවන බව ප්‍රකාශ කර සිටින ලදී.

රටේ ජනතාවට මේ දිනවල අවශ්‍ය වන්නේ රට පාලනය කිරීම් පද්ධතියේ වෙනසක්ය. ජනතාව මේ දිනවල පත්ව සිටින අපහසුතාවය මෙන්ම ඉන්ධන පෝලිම්වල සිටීම ද ඔවුන්ට දැඩි පීඩාකාරී තත්ත්වයක් වී ඇත. එම නිසා තිස්සමහාරාමයට පැමිණෙන ඉන්ධන බෙදා දීම සඳහා ප්‍රාදේශීය ලේකම්තුමිය සමඟ සාකච්ඡා කර සුදුසු වැඩපිළිවෙලක් සකස් කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

ජනතා විමුක්ති පෙරමුණ පක්ෂය විසින් විවිධ විවිධ අදහස් දක්වා ජනතාව කෝප කරනු ලබයි. එම පක්ෂයේ නියෝජිතයින්ගෙන් ඉල්ලා සිටින්නේ ජනතාව මෙලෙස උසි ගන්නා කෝපකාරී ක්‍රියාවන් සිදු නොකර, රට භාර ගැනීමට කැමති නම් එක් පියවරක් ලෙස ඉවසීමෙන් සිට ඡන්ද

විමසීමකදී එයට මුහුණ දී රට භාර ගත යුතුය. නැතහොත් මෙලෙස ක්‍රියා කිරීමෙන් රට ලේ විලක් කර විනාශ කර දමා රටේ පාලනය භාර ගැනීමට සිදු වේ. එමගින් සුදුසු පියවරක් තෝරා ගෙන ඔවුන්ට රට භාර ගත හැකි බව ප්‍රකාශ කර සිටින ලදී.

2022.05.09 වන දින අප ප්‍රදේශයේ සිදු කළ ප්‍රචණ්ඩකාරී ක්‍රියාව හේතුවෙන් නිවාස ගිණි තැබීම්, කුඩු කර දැමීම් සිදු කළ පිරිසක් මේ වන විට නීතියේ රැහැනට අසු කර ගෙන ඇත. ඔවුන්ට සහ සැංගී සිටින පිරිස් ද නීතියේ රැහැනට අසු කර ගෙන නිසි දඩුවම් ලබා දිය යුතුය. යම් පක්ෂයක් පිරිසක් විසින් රට ගොඩනැගීමට සිතා මෙලෙස විනාශකාරී ක්‍රියාවන් සිදු කලේ නම් එම සියලුම දෙනාට අනිවාරයෙන් දඩුවම් ලබා දිය යුතු බව ප්‍රකාශ කරන ලදී.

එසේම රට මේ වන විට පත්ව ඇති අර්බුදකාරී තත්ත්වයෙන් රට ගොඩ නැගීමට පාට පක්ෂ භේද නොබලා සියලුම දෙනා එකට එක්ව කටයුතු කළ යුතු බවත් සඳහන් කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>රට තුළට ඉන්ධන ගෙන ඒම සඳහා අතිගරු ජනාධිපතිතුමා වැඩපිළිවෙලක් සකස් කර ඇති බැවින්, බොහෝ දුරට 2022.07.12 න් පසුව මෙම ගැටළුකාරී තත්ත්වය විසඳා ජනතාවට අවශ්‍ය ඉන්ධන ලබා දීමට හැකියාව පවතින බව ප්‍රකාශ කරන ලදී.</u>

❖ <u>ගරු ප්‍රාදේශීය සභා සභික, හර්ෂ ජයවීර මහතාගේ අදහස් දැක්වීම</u>

2022.05.09 වන දින සිදු වූ ප්‍රචණ්ඩකාරී ක්‍රියාව නිසා ගරු සභාපතිතුමාගේ නිවස, දේපළ සහ වාහන කුඩු කර දැමීමක් සිදු කරන ලදී. එහිදී සභාවේ කැබ් රථය ද කුඩු කර දමා ඇත. එම සිදුවීම එසේ සිදුවුවත්, ගම්වල එම සිදුවීම සම්බන්ධයෙන් වැරදි පුවත් ප්‍රචාරය වන බැවින්, මෙම සිදුවීමට සම්බන්ධ වීඩියෝ පවතින්නේ නම් එය සමාජ මාධ්‍ය ජාලයට හෝ මුදා හැර මෙම සිදුවීමේ සත්‍යතාවය ජනතාව වෙත දැන්වීම සුදුසු වන බව දන්වා සිටින ලදී.

ඉන්ධන ප්‍රශ්නය 2022.07.12 දිනෙන් පසුව විසඳේ යනුවෙන් ගරු සභාපතිතුමා ප්‍රකාශ කළ පුවත සත්‍ය වුවහොත් ඉන්ධන ගැටළුව යම්තාක් දුරට හෝ විසඳේ යැයි සිතේ. එසේම ඉන්ධන ලබා දීමේ දී සියලුම දෙනාට ඉන්ධන ලබා ගත හැකි වන පරිදි වැඩපිළිවෙලක් සකස් කළ යුතු බවත් දන්වා සිටින ලදී.

ඉන්ධන නොමැති ගැටළුව නිසා යම් හදිසි අවශ්‍යතාවයක් වුවත් ක්‍රියාත්මක වීමට නොහැකි තරමට ජනතාව අසරණ වී ඇත. රෝගාතුර අවශ්‍යතාවයක් වුවහොත් 1990 සුවසැරිය තිබෙනවා සේම, මහජන නියෝජිතයින්ටද ඉන්ධන ලබා දීමේ වැඩපිළිවෙලක් සකස් කිරීමට හැකි නම්, ගමේ හදිසි අවශ්‍යතාවයක දී ඒ සඳහා අපට හෝ ක්‍රියාත්මක විය හැකි බව ප්‍රකාශ කර සිටින ලදී.

පන්නෙගමුව පොළ අඟහරුවාදා සහ සිකුරාදා යන දිනවල ප.ව. 2.00 පසුව වසා තබන බව වෙළඳුන් කිහිප දෙනෙක් ප්‍රකාශ කළ බැවින්, මේ සම්බන්ධයෙන් සොයා බලා ඔවුන්ට යම් සාධාරණයක් ඉටු කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

රබර්වත්ත ප්‍රදේශයේ ජනතාවට අහිතකර ආකාරයෙන් කොම්පෝස්ට් හලන ව්‍යාපෘතියක් පවත්වාගෙන යනු ලබයි. එමගින් ජනතාව දැඩි අසීරුතාවයකට පත්වන බැවින්, එම ව්‍යාපෘතිය එම ස්ථානයෙන් ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>2022.05.09 වන දින අපගේ නිවාස, වාහන කුඩු කර දමා අප හට සිදු කළ විනාශකාරී ක්‍රියාවන් සමඟ සමාජ මාධ්‍ය තුළින් එම සිදුවීම සම්බන්ධයෙන් වැරදි පුවත් ප්‍රචාරය වීම අපට තව තවත් වේදනාකාරී</u>

තත්ත්වයක් ඇති කරවන්නකි. මෙලෙස සමාජ මාධ්‍ය ජාලය හරහා වැරදි පුවත් ප්‍රචාරය කරන පුද්ගලයින්ට නිසි දඬුවම් ලබා දිය යුතුය. එම නිසා මෙම සිදුවීම නිවැරදි කිරීමට යම් කෙනෙක් කටයුතු කරන්නේ නම් ඔවුන් ද ත්‍රස්තවාදීන් ලෙස සලකා කටයුතු කිරීමට සිදු වන ප්‍රකාශ කර සිටින ලදී.

පන්නෙගමුව පොළ අඟහරුවාදා සහ සිකුරාදා යන දිනවල ප.ව. 2.00 පසුව විවෘතව තබන ලෙස ඉල්ලීම් කරනු ලබන්නේ වෙළඳුන් දෙදෙනෙක් පමණි. ඔවුන් අසරණ ගොවියාගෙන් අඩු මුදලට බඩු ලබා ගෙන පොළ පැවැත්වෙන දිනට ඉතා අධික මුදලකට විකුණනු ලබයි. මෙහිදී සිදු වන්නේ වැරදි ක්‍රියාවකි. එම නිසා ඒ සඳහා අවස්ථාවක් ලබා දිය නොහැක. එසේම පොළ පැවැත්වෙන දිනට පොළෙහි පවත්වාගෙන යන වෙළඳසැල, පොළ පැවැත්වෙන දිනයන්ට අමතරව අනෙක් දිනවලද පවත්වාගෙන යන බැවින්, එම සිල්ලර වෙළඳසැලෙන් ද ආදායම් අය කර ගැනීමට කටයුතු කරන ලෙසටත් උපදෙස් ලබා දෙන ලදී.

❖ **ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණී මහතාගේ අදහස් දැක්වීම**

රට මේ වන විට ඉතාමත් දරුණු තත්ත්වයකට පත්ව ඇත. ජනතාව ආහාරයට දෙයක් ගන්නේ කොහොමද, යමක් හරි හම්බ කර ගන්නේ කොහොමද යන අවධානමෙන් යුතුව සිටින කාලයකි මෙම කාලය. රටේ මේ වන විට ඇති වී ඇති තත්ත්වයට මුලිකවම බලපා ඇත්තේ පොහොර නොමැති වූ ගැටළුවයි. එම ගැටළුව සමඟ අනෙක් සියලු ගැටළු ගලා ඒමට පටන් ගන්නා ලදී. පොහොර ප්‍රශ්නය සඳහා හිටපු ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා විසින් ප්‍රකාශ කරන ලද්දේ යල් කන්නයට අවශ්‍ය කරන පොහොර එම කාලය තුළ අනිවාරයෙන් ලබා දීමට කටයුතු කරන බවයි. නමුත් එම කන්නය ආරම්භයේ ද පොහොර ලබා දීමට රජය විසින් කටයුතු සිදු නොකරන ලදී. ඉන් අනතුරුව පත් වූ වර්තමාන ගරු කෘෂිකර්ම අමාත්‍යතුමා විසින් ද ප්‍රකාශ කරන ලද්දේ යල් කන්නයේ කුඹුර කරන්න, ඊට අවශ්‍ය පොහොර එම කාලය තුල ලබා දීමට කටයුතු කරන බවයි. නමුත් එම කන්නයේ මුල පොහොර ලබා දීමට නොහැකි වූ නිසා, පසුව එතුමන් ප්‍රකාශ කරන ලද්දේ පොහොර නැව කුණාටුවකට අසු වූ බැවින්, පොහොර ලබා දීම ප්‍රමාද වන බවයි. තවත් අවස්ථාවල වෙනත් රටවල ප්‍රශ්න සමඟ සන්සන්දනය කර පොහොර ලබා දීම ප්‍රමාද කරන ලදී. ගොවි ජනතාවට අවශ්‍ය පොහොර ලබා දීම රටේ නායකයින්ගේ වගකීමකි. ගොවි ජනතාවට මෙලෙස වැටී සිටින තාක්, රට ගොඩ නැගිය නොහැක. අප ශ්‍රී ලංකාව කෘෂිකර්මාන්තයෙන් යැපෙන රටකි. අප රට තුළ මේ වන විට කෘෂිකර්මාන්තය නඟා සිටුවීමට දැක්මක් නොමැත. එම නිසා නිසි දැක්මකින් යුතුව කාෂිකර්මාන්තය නඟා සිටුවීමට කටයුතු කර ගොවියාට අවශ්‍ය කරන පොහොර ලබා දී රට ගොඩ නැගීමට රටේ නායකයින් කටයුතු කළ යුතුය.

එසේම ඊළඟ පොහොර නැව පැමිණි පසුව, ඊළඟ මාස් කන්නයේ වී වගාව සාර්ථකව සිදු කිරීමට, මාස් කන්නයට පෙර පොහොර ලබා දීමට වැඩපිළිවෙලක් සකස් කර ගත යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ගොවි ජනතාව පොහොර නොමැති ගැටළුවත් සමඟ ඉතාමත් අසීරුවෙන් වගාවක් සිදු කළද, එම භව භෝග අලෙවි කර ගැනීමට යාමේදී ද විවිධ ගැටළුවලට මුහුණ දීමට සිදු වේ. පොහොර ගැටළුවත්, ඉන්ධන අර්බුදයත් හමුවේ වගාවන් සිදු කර අඩු අස්වැන්නක් ලබා ගත්තද, එම අස්වැන්නද විකුණා ගත හැක්කේ ඉතාමත් අඩු මුදලකට වුවත්, එලෙස අඩු මුදලට ලබා ගන්නා අස්වැන්න මිලදී ගන්නා අය විසින් තවත් වැඩි මුදලකට විකුණු ලබයි. මෙලෙස සිදු වන ක්‍රියාවලිය ඉතාමත් වැරදි දෙයකි. රට තුළ පවතින මෙකී අර්බුදකාරී තත්ත්වයන් ගත් කළ රජය ඉතාමත් අසාර්ථක බව ද කිව යුතුය.

රට තුළ ඖෂධ හිඟයක් පවතිනවා සේම, ඖෂධ මාපියාවන් ද පවතී. තවද, අධ්‍යාපනය ගත් කළ රටේ විවිධ ප්‍රශ්න ගැටළු හමුවේ විවිධ අවස්ථාවල පාසල් වැසීමට කටයුතු කරනු ලබයි. තවත්

අවස්ථාවල පාසල් වසා දැමීම සම්බන්ධයෙන් විවිධ තීරණ ගනු ලබන අවස්ථාවන් ද පවතී. යම් යම් අවස්ථාවල පාසල් වසා දැමීමෙන් දරුවන්ගේ අධ්‍යාපනය ඔවුන්ට අහිමි වී යනු ඇත. දරුවන්ට විධිමත් හා නිවැරදි අධ්‍යාපනයක් ලබා දීමට නොහැකි වීම නිසා දරුවන්ගේ අනාගතය විනාශ වීමේ අවධානමක පවතින බව සඳහන් කරන ලදී.

අත්‍යාවශ්‍ය භාණ්ඩවල මිල ඉතා අධික ලෙස ඉහල ගොස් ඇති අතර, මත්ස්‍ය සම්පත ද ඉන්ධන ගැටළුව හමුවේ හිඟයක් පවතී. මෙලෙස ආහාරවල හිඟයත් සමඟ ගමේ දරුවන් කුමක් හෝ ආහාරයට ගත්තද, නගරයේ දරුවන්ට ආහාර නොමැතිකම නිසා මන්දපෝෂණ තත්ත්වයකට ද ඉදිරියේ ලක්විය හැකි බව ප්‍රකාශ කරන ලදී.

රට තුළ ඩෙංගු රෝගය ද හිස එසවීමට පටන් ගෙන ඇත. මේ වන විට බස්නාහිර පළාත තුළ ඩෙංගු මරණ වැඩි වී ඇත. ඒ අතරට රට තුළ නව කොරෝනා ප්‍රභේදයක් ද ව්‍යාප්ත වෙමින් පවතී. එම ප්‍රභේදය රට පුරාම ව්‍යාප්ත වුවහොත් රටේ දැනට පවතින තත්ත්වයත් සමඟ ඒ සඳහා ක්‍රියාත්මක වීමක් මෙම අවස්ථාවේ සිදු කළ නොහැකි බවත් දන්වා සිටින ලදී.

ඉන්ධන අර්බුදයත් සමඟ ජනතාව මේ වන විට දැඩි පීඩනයකින් සහ ප්‍රශ්න රැසක් සඳහා මුහුණ දෙමින් සිටී. රටට මේ වන විට ඇති වී ඇති අර්බුදකාරී තත්ත්වයට එක් කණ්ඩායමක් නොව, සියලුම දේශපාලන පක්ෂ වගකිව යුතු වන බව ප්‍රකාශ කරන ලදී.

රට තුළ පවතින විවිධ මාපියාවන්ට විදුලි මාපියාව ද එක්ව ඇති බව සඳහන් කළ යුතුය. සූර්ය පැනල ලබා ගැනීම සඳහා අප ගරු සභිකයින් කිහිප දෙනෙක් ද ඉල්ලීම් කර ඇත. මෙකී සේවාවන් ලබා ගැනීමට යාමේදී ද අල්ලස් ලබා ගනු ලබයි. මෙලෙස අල්ලස් ගනු ලබන්නේ ඒවාට සම්බන්ධ රාජ්‍ය නිලධාරීන් පිරිසක්  විසින්ය. එම නිසා මෙවැනි නිලධාරීන් සම්බන්ධයෙන් සොයා බලා විමර්ශනයකට ලක් කර ඔවුන්ගේද වත්කම් බැරකම් සම්බන්යෙන් සොයා බැලිය යුතු බව දන්වා සිටින ලදී.

2022.05.09 වන දින සිදු කළ අරගලය සේම, 2022.07.09 වන දිනත් අරගලයක් සිදු කිරීමට කටයුතු සැලසුම් කරමින් පවතින බව ප්‍රචාරය වෙමින් පවතී. අරගල සිදු කරන්නේ නම් එය සාමකාමීව සිදු කළ යුතුය. එසේ නොමැතිව 2022.05.09 වන දින සිදු කළ පරිදි නැවත අරගල සිදු කරන්නේ නම්, ඒ සඳහා අප ද නැගී සිට කටයුතු කරන බව ප්‍රකාශ කරන ලදී. තවද, එලෙස විනාශකාරී ලෙස අරගල සිදු කරන්නේ නම් ඒ සඳහා අප දැඩි සේ විරුද්ධ වනු ඇත.

එසේම මිනිසුන් උසි ගන්නවා අරගලකාරී තත්ත්වයන් ඇති කරලීමට කටයුතු කරන්නේ නම්, ආහාර හිඟයක් පවතින මෙවන් කාලයක අරගලයේ නාමයෙන් එම සියලුම දෙනා එකතු වී වගා සංග්‍රාමයක් සිදු කිරීම වඩාත් යෝග්‍ය වන බව ප්‍රකාශ කර සිටින ලදී. එසේම බෝග වගාව ඉඩකඩ ප්‍රමාණවත්ව නොතිබුණද, මල් පෝච්චියක් තුළ හෝ වගා කටයුතු සිදු කිරීම ආරම්භ කරන්නේ නම්, නිවසට අවශ්‍ය ආහාර ප්‍රමාණය යම්තාක් දුරට හෝ ලබා ගත හැකි බවත් දන්වා සිටින ලදී.

තිස්සමහාරාමයේ ඉන්ධන පිරවුම්හල් කිහිපයක් තිබේ. එම නිසා ග්‍රාම සේවා වසම් 44 හිම ජනතාවට එම ඉන්ධන පිරවුම්හල් වෙතින් ඉන්ධන ලබා ගත හැකි වන පරිදි වැඩපිළිවෙලක් සකස් කර, තිස්සමහාරාම ප්‍රදේශයේ අසරණ ජනතාවට ඉන්ධන ලබා දීමට කටයුතු කළ යුතුය.

ගරු සභාපතිතුමාටත්, ගරු සභික ටෂිත සමිල මහතාටත්, ගරු සභික චතුමිණි දිල්ෂානි මෙනවියටත් 2022.05.09 වන දින සිදු කළ ප්‍රචණ්ඩකාරී ක්‍රියාවෙන් සිදු වූ නිවාස, දේපළ, වාහන හානි වීම් සම්බන්ධයෙන් නැවත වරක් කණගාටුව ප්‍රකාශ කරන ලදී. ඔවුන් එම විනාශ කළ දේවල් දේශපාලනයෙන් උපයා ගත් දේවල් නොවේ. දේශපාලනයට පිවිසීමට පෙර තමන් සිදු කරන රැකියාවලින් සහ දහඩිය මහන්සියෙන් උපයා ගත් මුදලින් ගොඩ නගා ගත් දේවල්ය. එසේම අප අනෙක් ගරු සභිකයින්ද දේශපාලනයෙන් හරි හම්බ කර ගත් දෙයක් නොමැත. ඔවුන් සෑම

අවස්ථාවකම තම පෞද්ගලික් මුදල් ද වියදම් කර ජනතා සේවය සිදු කර ඇත. උදාහරණයක් ලෙස අප සභාවේ හිටපු සභාපති හර්ෂ ජයවීර මහතාගේ පියා පළාත් සභා මන්ත්‍රීවරයෙකු ලෙස කටයුතු කළ කාලයේ තම පෞද්ගලික මුදල් වියදම් කර, ණය මුදල් ලබා ගෙන ජනතා සේවය කළ බව මා හොඳින්ම දන්නා කරුණකි. එම නිසා ජනතාව වෙනුවෙන් ඇප කැප වී සේවය කරන මහජන නියෝජිතයින් හට මෙලෙස විනාශකාරී ක්‍රියාවන් සිදු කළ සියලුම දෙනාට එහි විපාකය සහ සාපය අනිවාරයෙන්ම යම් දිනක ලැබෙන බවත් දන්වා සිටින ලදී.

❖ <u>ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතාගේ අදහස් දැක්වීම</u>

ගරු සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා ප්‍රකාශ කළ පරිදි අපගේ සභා කාලය තුළ අප හට ජනතාව වෙනුවෙන් ඉටු කිරීමට හැකි වුයේ ඉතාමත් අල්ප වු සේවාවකි. ජනතාවට සේවාවන් රැසක් ඉටු කර දීමට නොහැකි වීම සම්බන්ධයෙන් ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා කණගාටු වුවත් ඒ සම්බන්ධයෙන් ඔහු සතුටු විය යුතුය. මක් නිසාදයත් අප 1980 වර්ෂයන්වල සිටම දේශපාලනය සිදු කර, එමගින් ජනතාවට බොහෝ සේවාවන් ඉටු කර දීමට කටයුතු කරන ලදී. ඒ අතර එවක රන්මිණිතැන්න ගම්මානය යනු ඉතාමත් දුෂ්කර ප්‍රදේශයෙකි. එම ගම්මානයේ පැල්පත් නිවාස සඳහා නිවාස ලබා දෙමින්, මාර්ග සංවර්ධනය කරමින්, ජල විදුලිය ලබා දෙමින් සංවර්ධනය කිරීමට අප කටයුතු කරන ලදී. එසේම 1992 වර්ෂයේ රන්මිණිතැන්න සඳහා බස් රථයක් යෙදවීමට කටයුතු කළද, එයද දේශපාලන මැතිවරණයක් අතලඟ තිබියදී සිදු කළා යනුවෙන් වැරදි පුවත් ප්‍රචාරනය කරන ලදී. මෙකී සියලුම සේවාවන් සිදු කරන ලද්දේ අප ප්‍රදේශයන්වල ජනතාව වෙනුවෙන් මිසක දේශපාලන අරමුණු ඉටු කර ගැනීමට නොවේ. එලෙස අප ජනතාව වෙනුවෙන් කැපකිරීම් සිදු කරමින් සේවාවන් ඉටු කළද, අද ජනතාව ඒ ගැන නොසලකා හරිමින් අප හට ගල් ගැසීමට කටයුතු කිරීම ඉතාමත් කණගාටුවට කරුණකි.

කොරෝනා කාලය තුළදී අසරණව සිටි ජනතාව වෙනුවෙන් පාට පක්ෂ භේද නොබලා වියළි ආහාර මලු, ආහාර පාර්සල් ලබා දීමට අප විසින් කටයුතු කරන ලදී. නමුත් අප මනුෂ්‍යත්වයෙන් සිදු කළ එම සත්කාරයද අප දේශපාලන වාසි බලාපොරොත්තුවෙන් සිදු කලා යැයි වැරදි මත ජනතාව විසින් ප්‍රකාශ කරනු ලබයි. ඔවුන්ගේ මෙවැනි මතවලින් අපට වටහා ගත යුත්තේ මිනිසුන් කෙරේ පවතින මනුස්සකම වර්තමානය වන විට ගිලිහී ගොස් ඇති බවයි. මෙකී කරුණු සම්බන්ධයෙන්ද කණගාටු විය යුතු බව ප්‍රකාශ කරන ලදී.

රට තුළ 2022.05.09 වන දින සිදු වු ප්‍රචණ්ඩකාරී අරගලයක් 2022.07.09 වන දිනක් සිදු කිරීමට රට තුළම සැලසුම් සංවිධානය වෙමින් පවතින බැවින්, ඒ පිළිබඳව අවධානයෙන් යුතුව කටයුතු කළ යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

ඉන්ධන පෝලිම්වලද මිනිසුන් විසින් වැරදි ක්‍රියාවන් සහ මත් ද්‍රව්‍ය ජාවාරම් කටයුතු සිදු කරනු ලබයි. මෙකී කරුණු ගත් කළ මිනිසුන්ගේ සදාචාරාත්මකතාවය ගිලිහී ගොස් ඇති බව කිව යුතුය. එම නිසා ඉන්ධන පෝලිම්වලද සිදු වන මෙවැනි වැරදි ක්‍රියා සම්බන්ධයෙන් සොයා බලා කටයුතු කළ යුතු බවත් දන්වා සිටින ලදී.

සභාවේ කැබ් රථයද ගරු සභාපතිතුමාගේ නිවසේ තිබියදී, 2022.05.09 වන දින සිදු වු ප්‍රචණ්ඩකාරී ක්‍රියාව හේතුවෙන් කඩා බිඳ දමන ලදී. නමුත් මෙම ප්‍රචණ්ඩකාරී ක්‍රියාවට නිසි ලෙස දඬුවම් ලබා දිය හැක්කේ පොදු දේපල පනත යටතේ නිසා, සභාපතිතුමාගේ නිවසේ අයම, සභාවේ කැබ් එක කුඩු කර දමා ඇති බවට වැරදි පුවත් ජනතාව විසින් ප්‍රකාශ කරනු ලබයි. එම නිසා මීට සම්බන්ධ සියලුම දෙනා නීතියේ රැහැනට අසු කර නිසි දඬුවම් ලබා දී මෙලෙස ප්‍රචාරය වන වැරදි පුවත්වල සත්‍යතාවය පෙන්වා දිය යුතු බවත් ප්‍රකාශ කරන ලදී.

2022.05.09 වන සිදු වූ ප්‍රචණ්ඩකාරී අරගලයට සම්බන්ධ වී මේ වන විට සැංගී සිටින පිරිස් 2022.07.09 වන දින සිදු කිරීමට නියමිත අරගලයට සම්බන්ධ විය හැකි බැවින්, මේ සම්බන්ධයෙන් දැඩි අවධානයක් යොමු කළහොත්, එදිනට ඔවුන්ව නීතියේ රැහැනට අසු කර දීමට කටයුතු කළ හැකි බව ප්‍රකාශ කරන ලදී.

❖ <u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතාගේ අදහස් දැක්වීම</u>

රට තුළ කොරෝනා වසංගත තත්ත්වය ව්‍යාප්ත වූ කාලයේ අප ප්‍රදේශයේ ජනතාව එම වෛරසයෙන් බේරා ගැනීම සඳහා කොරෝනා එන්නත් මර්ධන වැඩසටහන් කිසිදු පාට පක්ෂ භේදයක් නොබලා සිදු කරන ලදී. එසේම එම රෝගයේ අවධානම ද නොතකා නිරෝධායනය වන පවුල් සඳහා වියළි ආහාර පාර්සල් ලබා දීමට කටයුතු කරන ලදී. ජනතාව වෙනුවෙන් එසේ කැප වී කටයුතු කරන අපම දිගින් දිගටම විවිධ ක්‍රියාවන් සිදු කර මානසිකව වැට්ටවීමට කටයුතු කිරීම ඉතාමත් කණගාටුදායක තත්ත්වයක් බව සඳහන් කරන ලදී.

අප පත් වූ මෙම සභා කාලය තුළ දේශපාලන වශයෙන් යම් යම් මත ගැටුම්, වාක් ප්‍රහාර තිබුණද, කිසි දිනක ගැටුම්කාරී තත්ත්වයක් ඇති කර ගෙන නොමැත. පසුගිය සභාවේ දී යම් ප්‍රශ්නයක් ඇති වුයේ නම්, එය ඇති වුයේ 2022.05.09 වන දින සිදු කළ ප්‍රචණ්ඩකාරී ක්‍රියාව හේතුවෙන් බව කිව යුතුය. පසුගිය දිනයන්වල සිදු වූ මෙම සිදුවීම් මාලාව දිගින් දිගටම රැගෙන යාමට අප කිසිදු කැමැත්තක් නොමැත. එම නිසා සිදු වූ මෙම සිදුවීම් ගැන නොසිතා ඊළඟ මහා සභාවේ සිට පෙර පරිදිම ජනතාව වෙනුවෙන් සේවය කිරීමට අප සියලුම දෙනා වග බලා ගත යුතු බවත්, එලෙස සිදු කරන්නාවූ ක්‍රියාවන්වලදී තමාට ඒ සඳහා සියලුම දෙනාගේ සහාය ලබා දෙන ලෙසත් ඉල්ලා සිටින ලදී.

මේ දිනවල පවතින ඉන්ධන අර්බුදය හමුවේ වුවත් මාසික මහා සභාව සඳහා පාපැදිවලින් සහ බස් රථ වලින් හෝ පැමිණීම පිළිබඳව සියලුම දෙනාට ස්තූතිය පුද කරන ලදී.

අද දින මහා සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබා දුන් ගරු උප සභාපති, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්ට හා ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරී මහත්මියටත්, ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ස්තූතිය පුද කිරීමෙන් අනතුරුව ප.ව. 12.20 ට පමණ මහා සභාවේ කටයුතු අවසන් කරන ලදී.

වාර්තා කළේ - ඩී. රුවිනා දීපානි,
ලේකම්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

සභාපති,
ඩබ්ලිව්.ජී. උපුල්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

2022.07.08 දින තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.